# ශුද්ධ වූ පැය



**ශ්‍රී ලාංකික කතෝලික සංඝය**

**සිංගප්පූරුව**

- ආරම්භක ගීතිකාව

## ආරම්භක යාච්ඤාව

අහෝ මාගේ අමෘතබරවූ ජේසුනි, මාගේ එකම ප්‍රේමයෙනි! අපගේ පාපවලින් සහ නොසැලකිම්වලින් ද ඔබගේ ශ්‍රී හෘදයට දෙන්නාවූ දුක් කණගාටු වලින් පිරී සුසුම්ලමින් "මා සමඟ දුක් ශෝක වීමට යමෙකු බලා සිටියෙමි. එහෙත් කිසිවෙක් නොසිටියේය. මා සනසන්නකු සෙව්වෙමි. නමුත් කිසිවෙක් සම්භනූනේය" යි (ගීතා 69:20) ඔබවහන්සේ වදාළ සේක් වේද? ඔබගේ මේ කන්නලව්ව අසා මගේ හෘදය ශෝකයෙන් දැල්වී, මාගේ ප්‍රේමයෙන් සත්ප්‍රසාදයෙහි රෑ දවල් දෙක්හිම වැඩ සිටින්නා වූ ඔබවහන්සේගේ දයාබර දිව්‍ය හෘදයට සැනසීම දෙන්නට ආශාවෙමි.

අනේ මාගේ දුක්බරිත ජේසුනි, ඔබගේ මේ දුක් ශෝකයට හේතු වූ මාගේ ගණන් නැති පව් වන්නේ වේද? නමුත් මගේ පෙම්බර ජේසුනි, මාගේ පාපවලට කෝප නොවී ඔබ මා උදෙසා වින්ඳාවූ දුක් ප්‍රාප්තිය සිහිකර, දයාවන්ත පියාණෝ ඔහුගේ නාස්තිකාර පුත්‍රයා භාරගන්නාක් මෙන් (ශු. ලුක් 15: 20-21) මා වෙත කරුණා බැල්ම ලා වදාළ මැනව. පාපිෂ්ඨ මරිය මග්දලේනා කෙරෙහි කරුණාවෙන් බලා "නුඹේ පව් නුඹට ක්ෂමා වූවාය" (ශු. ලුක් 7: 48) වදාළාක් මෙන් මගේ පාපවලුත් මට ක්ෂමා වුව මැනව. අනේ මාගේ පෙම්බර ජේසුනි, ඔබගේ දිව්‍ය හෘදයේ ප්‍රේම දූවණිය වන මර්ගරීතා මරියතුමීට "මගේ හෘදයට සැනසිලිදායක බිලි පඬුරක් සොයන්නෙම් මම නුඹ තෝරා ගත්තෙමි" යි වදාළාක් මෙන් අසරණ පවුකාර වූ මාත් ඔබවහන්සේට සැනසීමක් කොට ඔබ දිව්‍ය හෘදයට බාරගත මැනව. එලෙස ජීවිතය පසුකිරීමට මට වරප්‍රසාද දුන මැනව. ඔබගේ දිව්‍ය ප්‍රේමයෙන් මාගේ හෘදය දැල්වුව මැනව.
(සියල්ලෝම) ජේසු තුමාන්ගේ මධුර වූ හෘදයෙනි, මාගේ ප්‍රේමය වුව මැනව.

(300 දවස් පූර්ණඵලයි)

මාගේ පෙම්බර ජේසුනි, මාගේ පාපවලට මන්ස්ථාප වී ඔබ කෙරෙහි ප්‍රේමයෙන් දැල්වී ඔබගේ ආදරණිය දුවණියගෙන් ඉල්ලූ ප්‍රකාර ඔබ මල් උයනේදී වින්ඳාවූ කඨුර දුක් ගාවිනාවලට පංගුකාරයන් වීමට ද, "ඔබට සැනසීම දීමටද, මමත් මේ පැයේදී ඔබ සමඟ මල් උයනේදී ඔබ කළාවූ යාච්ඤාවට සහ වින්ඳාවූ දුකටද එකග වීමට මට වරම් දුන මැනව. මා බාරගත මැනව. මට ආශීර්වාද කළ මැනව.

අහෝ වික්ෂෝප මෑණියෙනි, ඔබ ප්‍රිය පුතුවූ ජේසුස් ස්වාමි දරුවෝ මල් උයනේදී තනිව මරණය දක්වා දුකින් සිටින විට උන්වහන්සේට සැනසිලි වචනයක්වත් කියන්නට නොහැකිව, ඔබ වින්ඳාවූ දුක් සාගරය සිහිකර මේ පැයේදී මාගේ හෘදය


ඔබගේ වික්ෂෝප හෘදයට එකගකර, ඔබ සමග අඬා වැලපී, ඔබගේ ප්‍රේමයට මාගේ ප්‍රේමය එකගකර, උන්වහන්සේට සැනසීම දෙන්ට මට පිහිට වූව මැනව.

## දයාධික මනස්ථාපය

(සියල්ලෝම) මාව මවා රක්ෂා කරන්නාවූ මාගේ ඒකාන්ත පක්ෂ ප්‍රේමවූ දෙවි ස්වාමිනී, ඔබගේ අනන්ත දයා යහපත්කම් මම නොබලා ඔබට අනදර කළ නිසා බොහෝ සේ වික්ෂෝප වෙමි. මින්මතු පව් නොකරන සැටියට ඔබවහන්සේගේ පිහිටෙන් සහතික වෙමි. මම කළ සියලු පාපවල් ක්ෂමා වෙනවා සොඳේ. ඔබගේ අනන්ත දයාබර කමුත් ක්‍රිස්තු ස්වාමිදරුවන්ගේ අප්‍රමාණ පින් හේතුවත් බලා මාගේ සියලු පව් ක්ෂමා වෙතෙයි කියා අදහා ගනිමි. – ආමෙන්.

ප්‍රඃ ක්ෂමාවූව මැනව. ස්වාමිනී, ඔබගේ ජනයාට ක්ෂමාවූව මැනව.

උඃ සදාකාලයටම අප කෙරෙහි කෝප නොවෙනවා සොඳේ.



# පළමුවෙනි පැයකාල

*"මා මැරෙන තරම් මාගේ ආත්මය ශෝකයෙන් පීඩිත වන්නේය." (ශු. මතෙව් 26:38)*

අහෝ පෙම්බර ජේසුනි, ඔබ අප කෙරෙහි තිබෙන මහත් ප්‍රේමය නිසා අප සමඟ ලෝකාන්තිමය දක්වා වාසය කරන පිණිසද, අප ආත්මික භෝජනය කොටද, අප හෘද ඔබ ප්‍රේමයෙන් දල්වන පිණිසද, ශුද්ධවූ සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළ සේක.

ඉන්පසු එම රාත්‍රියේදීම අප පාපයෙන් සහ යක්ෂයාගේ වහල්කමින් ගලවාගන්නා පිණිස මල් උයනට වැඩම කොට මුහුණින් වැටී ඔබවම බිලිපඬුරක් කොට ඔප්පු දුන්සේක.

අහෝ! මාගේ ආත්මයෙනි, පාපයේ ද්‍රෝහීකම මෙයින් තේරුම්ගන්ට පුළුවන. ජේසු ස්වාමිදරුවෝ අපගේ සියලු පාපවලට වන්දි ගෙවීම පිණිස ඒ සියල්ලම උන්වහන්සේ පිටම පවරා ගත්සේක. එකල්හි පාපවල පිළිකුල්කම් සහ අපිරිසිදුකම්වලින් අශික්ෂිත කුෂ්ඨ රෝගයකින් වැසී සිටින දේව ද්‍රෝහියෙක් මෙන් භයානක දුක් කණගාටු වලට පත්වූ සේක. එකල්හි දැරිය නොහැකි දුක් ශෝකයෙන්, උන්වහන්සේ මුහුණින් වැටී "මා මැරෙන තරම් මාගේ ආත්මය ශෝකයෙන් පීඩිත වන්නේය" යි (ශු. මතෙව් 26:38) වදාරණ සේක. එය උසුලාගන්ට බැරිවාක් මෙන් "උන්වහන්සේගේ ඩාදිය පොළොවෙහි ලේ බිංදුමෙන් ගලා ගියේය." (ලූක් 22/44) ජේසුස් ස්වාමිදරුවෝ මේ වින්දාවූ දුක් ගැන ශුද්ධවූ මර්ගරීතා මරියතුමීට මෙසේ වදාළ සේක. "පාපයේ ද්‍රෝහිකම සහ පිළිකුල් කමද මනුෂ්‍යයා නොදන්නා බැවින්, මම මල් උයනේදී වින්දාවූ දුක ඔහුට තේරුම් ගන්නට බැරිවිය."

එපමණක් නොව, මෙපමණ කදුරවූ දුක් ගාවිනා වින්දායින් පසුත් සදාකාලික නරකාදියට යන්නාවූ මනුෂ්‍ය රාශිය සිහිකර තවත් දුක් ශෝකයට පත්වී වඩ වඩා යාච්ඤා කළ සේක. (ලූක් 22:43)

අනේ! සර්වදයාබර වූ ජේසුනි! අප පාපවල් ඔබ පිට පවරාගෙන ඊට වන්දි ගෙවීමට කුරුසියේ එල්ලී සිටිද්දී ඔබ පියාණන්ගේ රෞද්‍ර බැල්ම ඉවසන්ට බැරිව, "මාගේ දෙවියනී, මාගේ දෙවියනී, ඔබ මා අත්හැරියේ මන්දැ" යි කියා මොරගැසුවෙහි නම් (මතෙව් 27: 46) පාපයෙහි ගිලී මරණාසන්නව සිටින්නන්ට එය කොපමණ භයන්කර වේද?

ප්‍ර: ජේසුස් ස්වාමිදරුවන්ගේ මරණාසන්නව සිටි හෘදයෙනි.

උ: මරණාසන්නව සිටින්නන්ට කරුණා කළ මැනව.

අහෝ මාගේ ආත්මයෙනි, මා කෙරෙහි මෙපමණ ප්‍රේමය පෙන්වන්නාවූ දෙවියන් වහන්සේට විරුද්ධව කෙසේ පව් කළෙම්ද? නිව ලෙස සහ නැවත නැවතත් කොපමණ වාරයක් පව් කෙළෙම්ද? අනේ ජේසුනි, මට ක්ෂමා වුව මැනව. ඔබවහන්සේගේ පිහිටෙන් මින්මතු පාපයක් නොකරන්නට පොරොන්දු වෙමි.

වික්ෂෝප මාතාවෙනි, මාගේ පෙම්බර මෑණියෙනි, මට පිහිට වුව මැනව.

## ජේසුස් ස්වාමිදරුවන්ගේ දුක්ප්‍රාප්තියේ විලාපය

*(කැමතිනම් මේ වෙනුවට මෙහි අග උපග්‍රන්ථයෙහි සඳහන් යාච්ඤාවක් කිය හැකිය)*

1. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කෙළෙම්ද? කුමකින් තට මම පීඩා කෙළෙම්ද? මට උත්තර දෙව?

*ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.*

1. අහෝ ශුද්ධවූ දෙවියන්වහන්ස,
   2. අහෝ ශුද්ධවූ දෙවියන්වහන්ස

1. අහෝ ශුද්ධවූ ශක්ති සම්පන්නයාණන් වහන්ස,
   2. අහෝ ශක්ති සම්පන්නයාණෙනි,

1. අහෝ ශුද්ධවූ අමරණීයයාණන් වහන්ස, අපට කරුණා කළ මැනව.
   2. අහෝ ශුද්ධවූ අමරණීයයාණන් වහන්ස, අපට කරුණා කළ මැනව.

*සතලිස් අවුරුද්දක් මුළුල්ලේ කාන්තාරයෙන් තා ගෙන ගොස් මන්නා බොජුන් කවා ඉතා යහපත් දේශයකට තා පැමිණෙව් නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කළෙහිය.*

1. අහෝ ශුද්ධවූ දෙවියන්වහන්ස,
   2. අහෝ ශුද්ධවූ දෙවියන්වහන්ස

1. අහෝ ශුද්ධවූ ශක්ති සම්පන්නයාණන් වහන්ස,
   2. අහෝ ශක්ති සම්පන්නයාණෙනි,

1. අහෝ ශුද්ධවූ අමරණීයයාණන් වහන්ස, අපට කරුණා කළ මැනව.
   2. අහෝ ශුද්ධවූ අමරණීයයාණන් වහන්ස, අපට කරුණා කළ මැනව.

*මා විසින් කරන්නට ඕනෑ දෙයින් කුමක් නොකර හැරියෙම් ද? මාගේ ඉතා රුව ඇති මිදි වත්ත තට වවා දුනිමි. එහෙත් මාගේ පිපාසයේදී තෝ මට කාඩි බොන්නට දුන් බැවින් තෝ මට ඉතා තිත්ත වුනෙහිය. හෙල්ලයකින් තගේ ගැළවුම්කාරයාගේ ඇළය සිදුරු කෙළෙහිය.*

1. අහෝ ශුද්ධවූ දෙවියන්වහන්ස,
   2. අහෝ ශුද්ධවූ දෙවියන්වහන්ස

1. අහෝ ශුද්ධවූ ශක්ති සම්පන්නයාණන් වහන්ස,
   2. අහෝ ශක්ති සම්පන්නයාණෙනි,

1. අහෝ ශුද්ධවූ අමරණීයයාණන් වහන්ස, අපට කරුණා කළ මැනව.
   2. අහෝ ශුද්ධවූ අමරණීයයාණන් වහන්ස, අපට කරුණා කළ මැනව.

1. තා නිසා එජිප්තුවේ කුළුඳුලන්ට පහර දුනිමි. එහෙත් තා මට පහරදී මා පාවා දුන්නෙහිය.
   2. අහෝ මාගේ සෙනඟෙනි, තට මම කුමක් කෙළෙම්ද? කුමකින් තට මම පීඩා කෙළෙම්ද? මට උත්තර දෙව?

*ඒජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.*

1. පාරාවොන් රතු මුහුදෙහි ගිල්වා තා එජිප්තුවෙන් පිටතට මම ගෙනාමි. එහෙත් තෝ මා නායක පූජකයින්ට අල්ලා දුන්නෙහිය.
   2. අහෝ මාගේ සෙනඟෙනි, තට මම කුමක් කෙළෙම්ද? කුමකින් තට මම පීඩා කෙළෙම්ද? මට උත්තර දෙව?

*ඒජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.*

1. තා ඉදිරියෙහි මුහුද ඇරියෙමි. එහෙත් තෝ හෙල්ලයකින් මාගේ ඇලය ඇරියෙහිය.
   2. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කෙළෙම්ද? කුමකින් තට මම පීඩා කෙළෙම්ද? මට උත්තර දෙව?

*ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.*

1. තම පෙරටුව මේඝ ටැඹකින් මම ගියෙමි. එහෙත් තෝ මා පිලාත්තුගේ නඩු ශාලාවට ගෙන ගියෙහිය.
   2. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කෙළෙම්ද? කුමකින් තට මම පීඩා කෙළෙම්ද? මට උත්තර දෙව?

*ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.*

1. කාන්තාරයේදී මන්නා බොජුනෙන් මම තා පෝෂ්‍ය කෙළෙමි. එහෙත් තෝ මට බැට දුන්නෙහිය.
   2. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කෙළෙම්ද? කුමකින් තට මම පීඩා කෙළෙම්ද? මට උත්තර දෙව?

*ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.*

1. පර්වතයෙන් ගැළවීමේ වතුර මම තට පෙවීමි. එහෙත් තෝ මට තිත්තත් කාඩිත් දුන්නෙහිය.
   2. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කෙළෙම්ද? කුමකින් තට මම පීඩා කෙළෙම්ද? මට උත්තර දෙව?

*ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.*

1. තා නිසා කානානීය රජුන්ට මම පහර දුනිමි. එහෙත් තෝ මගේ සිරසට බට දණ්ඩකින් ගැසුවෙහිය.
   2. අහෝ මාගේ සෙනගෙනි, තට මම කුමක් කෙළෙම්ද? කුමකින් තට මම පීඩා කෙළෙම්ද? මට උත්තර දෙව?

*ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.*

1. මම තට රාජකීය ඔටුන්නක් දුනිමි. එහෙත් තෝ මගේ හිසට කටු ඔටුන්නක් දුන්නෙහිය.
   2. අහෝ මාගේ සෙනඟෙනි, තට මම කුමක් කෙළෙම්ද? කුමකින් තට මම පීඩා කෙළෙම්ද? මට උත්තර දෙව?

*ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.*

1. මහත් බලයෙන් මම තා උසස් කෙළෙමි. එහෙත් තෝ මා කුරුසිය නම් එල්ලුම් ගහේ එල්ලුවෙහිය.
   2. අහෝ මාගේ සෙනඟෙනි, තට මම කුමක් කෙළෙම්ද? කුමකින් තට මම පීඩා කෙළෙම්ද? මට උත්තර දෙව?

*ඊජිප්තු දේශයෙන් මම තා පිටතට ගෙනා නිසා තගේ ගැළවුම්කාරයාණන්ට කුරුසියක් තෝ ජෝඩු කෙළෙහිය.*

1. ස්වාමිනී අපි ඔබගේ කුරුසියට නමස්කාර කරමු. ඔබගේ ශුද්ධවූ නැවත නැගිටීමට ස්තුති ප්‍රශංසා කරමු. කුමක් හෙයින්ද නම් මුළු ලෝකෙට මේදන්ඩෙන් ප්‍රීතිය පැමුණුන සෙයින.
   2. දෙවියෝ අපට කරුණා කොට ආශීර්වාද කරන සේක්වා! උන්වහන්සේගේ ශ්‍රී වත එලිය අප පිට බබලන සේක්වා!

(සියල්ලෝ) ස්වාමීනී, අපි ඔබගේ කුරුසියට නමස්කාර කරමු. ඔබගේ ශුද්ධවූ නැවත නැගිටීමට ස්තුති ප්‍රශංසා කරමු. කුමක් හෙයින්ද නම් මුළු ලෝකෙට මේදන්ඩෙන් ප්‍රීතිය පැමුණුන සෙයින.

- ගීතිකාව

## දෙවෙනි පැයකාල

*"පියාණෙනි, මේ දුක් පාත්‍රය මාගෙන් අහක්විය හැකි නම් එසේ වේවා. නමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ අභිප්‍රාය සිදුවේවා." (ශු. ලූක් 22:42)*

අනේ පෙම්බර ජේසුනි, මනුෂ්‍යයාගේ උඩගුවෙන් සහ අකීකරුකමින් පාපය පැමිණුන බැවින්, ඔබගේ බැගෑපත් කීකරු කමින් ඊට වන්දි ගෙවීමට සහ එයින් අප මුදාගන්ටද කරුණා අභිප්‍රා කළ සේක්වේද? ඔබගේ ශ්‍රී ශරීරයෙන් ලේ ධහදිය වැගිරී ඔබගේ හෘදය දුකෙන් පොඩිවී, වෙව්ලමින් බියපත්වී, "මාගේ ආත්මය මැරෙන 'රම් ශෝකයෙන් පීඩිත වී, පියාණෙනි, මේ දුක් පාත්‍රය මාගේන අහක්විය හැතිනම් එසේ වේවා" යි වදාළ සේක්වේද?

ඔබගේ මනුෂ්‍ය ස්වභාවයට භයානක කඨුරවූ දුක් වේදනා පමුණුවා ගනිමින් ඔබ බැගෑපත් ලෙස සජ්ඨාංගයෙන් වැඳවැටී සිටින විට, මෙම දුක් පාත්‍රය සතුටින් වැළඳ ගත් සේක්වේද!

අහෝ මාගේ ආත්මයෙනි, අපේ සියලු දුක් කණගාටුවලදී, ජේසුස් ස්වාමිදරුවෝ අප කෙරෙහි පෙන්වන්නා වූ ප්‍රේමය බලා, මෙපමණ අපට ප්‍රේම ඇන්නා වූ දෙවියෝ, අපේ යම් යහපතකට හැර අයහපතක් හෝ යම් දුකක් හෝ, අපට පැමිණෙන්ට ඉඩනාරින බව විශ්වාස කරමු. ජේසුස් ස්වාමිදරුවෝ අප උදෙසා වින්දාවූ දුක් සිහිකර, අපේ වේදනා උන්වහන්සේගේ දුක් ප්‍රාප්තියට එකතු කරමු. උන්වහන්සේ මල් උයනේදී යාච්ඤා කළාක් මෙන් උන්වහන්සේ සමඟ අපිත් යාච්ඤා කරමු. "මාගේ පියාණෙනි, මෙම දුක්පාත්‍රය මාගෙන් අහක්විය හැකි නම් එසේ වේවා, එහෙත් මාගේ කැමැත්ත ලෙස නොව ඔබවහන්සේගේ කැමැත්ත ලෙස සිදුවේවා...... මාගේ පියාණෙනි, මෙම පාත්‍රය පානය කිරීමෙන් මිස එය මාගෙන් අහක් නොවේ නම්, ඔබවහන්සේගේ අභිප්‍රායම සිදුවේවා." (මතෙව් 26: 39–42)

අනේ මාගේ මැණියනි, ඔබ දිව්‍ය කුමාරයාණන්ගේ ශ්‍රී රුධිරයෙන්, මාගේ සියලු පාපවල් දෝවනය කළ මැනව. උන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය උදෙසා සියලු පාප පරීක්ෂා වලින් මා ගලවා ගත මැනව. උන්වහන්සේගේ මහිමතාවයෙන් මා පළඳවනු මැනව. ඔබගේ ගුණධර්මවලින් මා සැරසුව මැනව. ඔබගේ ශ්‍රී හස්තවලට මා රැගෙන අනේ වික්ෂෝප මැණියෙනි, මාගේ ජීවිතය උන්වහන්සේගේ අභිප්‍රාය සැටියට පසුකරන්නට මට පිහිටවී, මා පෙම්බර ජේසු තුමන්ගේ දිව්‍ය හෘදයට ප්‍රසන්න බිළිබඩුරක් මෙන් මා ඔප්පු කළ මැනව.

## යහපත් මරණයක් ලැබීමට යාච්ඤාව

ජේසුස් ස්වාමිදරුවෙනි, යහපත නමැති දෙවියනි, කරුණාව නමැති පියාණෙනි, ලැජ්ජාවූනාවූ බැහැපත් තැවුණු සිතින් ඔබවහන්සේට මා අභිමුඛව, මාගේ අන්තිම වේලාව සහ ඊට පසු ලංවෙන්නාවූ දෙයත් ඔබවහන්සේට බාර කරමි.

මාගේ පා සොලවන්නට බැරිවීමෙන් මාගේ මෙලොව ජීවිතයේ අන්තිමය ලංවෙන බව දක්වන කල්හි, අනේ! සර්වදයාබරිත වූ ජේසුනී, මා ගැන අනුකම්පා වුව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

මාගේ වෙව්ලන අත්බරා බැරිවී, කුරුසිය ප්‍රතිමාව තදින් අල්ලාගන්නට බැරිවී, මාගේ වේදනාව නමැති ඇඳ උඩ අකමැත්තෙන් වැටෙන්නට අරින කල්හි, අනේ! සර්වදයාබරිත වූ ජේසුනී, මා ගැන අනුකම්පා වුව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

මාගේ ඇස්දෙකම අඳුරුවී, ලංවෙන මරණයට භයවී, ඔබ දෙසට හැරී බලන කල්හි, අනේ! සර්වදයාබරිත වූ ජේසුනී, මා ගැන අනුකම්පා වුව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

මාගේ කම්මුල් සුදුමැලිව තිල්වී, ළඟ සිටින්නන් අනුකම්පා බියපත් කරවන කල්හිත් මාගේ හිසකෙස් ඇල්ඩහදියෙන් තෙලින් වී මාගේ අන්තිමය ලංවුණ බව දක්වන කල්හි, අනේ! සර්වදයාබරිත වූ ජේසුනී, මා ගැන අනුකම්පා වුව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

මාගේ කන්දෙක මනුෂ්‍යයින්ගේ කථාවලට නිරන්තරයෙන්ම බිහිරිවෙන්නට ආසන්න වී, සදාකාලයටම වෙනස් කළ නොහැකි වූ තීන්දුව කියන්නාවූ ඔබගේ හඬ ශබ්දය අසන්නට නමා තිබෙන කල්හි, අනේ! සර්වදයාබරිත වූ ජේසුනී, මා ගැන අනුකම්පා වුව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

මාගේ සිත භයානක විහිලු ජායා වලින් කැළඹී, මරණීය වූ ශෝකයෙහි ගිලී තිබෙන කල්හිත්, මාගේ ආත්මයද මාගේ නපුරුකම් දැක්මෙන් සහ ඔබගේ තීතියට

බියෙනුත් චංචල වී, ඔබගේ කරුණෑ සැනසීමේ දර්ශනය මාගෙන් දුරුකොට, මා ප්‍රාර්ථනා නැතිකමට අසුකරන්නට වෑයම් කරන්නාවූ අන්ධකාරයේ දූතයා සමග පොර අල්ලන කල්හි, අනේ! සර්වදයාබරිත වූ ජේසුනි, මා ගැන අනුකම්පා වූව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

මාගේ දුර්වලවූ හෘදය රෝගය වේදනාවලින් පීඩිතවී, මරණයේ භීතවලින් ගැස්සී, මාගේ ගැළවීමේ සතුරන්ට විරුද්ධව කළ වෑයම්වලින් කෙඩෙත්තු වෙගන යන කල්හි, අනේ! සර්වදයාබරිත වූ ජේසුනි, මා ගැන අනුකම්පා වූව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

මාගේ ජීවිතය අන්තිම වන බව දක්වන්නාවූ මරණාසන්න කඳුළු වගුරන කල්හි පශ්චත්තාප විලක් මෙන් මා මැරියන පිණිස, ඔබවහන්සේ මාගේ පව් ගෙවීමේ පූජාවක් කොට ඒ පිළිගෙන, අනේ! සර්වදයාබරිත වූ ජේසුනි, මා ගැන අනුකම්පා වූව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

මට සිහිය නැතිවීමෙන් මුළු ලෝකය නොපෙනී ගොස් මා මරණ වේදනා වලින් කෙඳිරිගාන කල්හි, අනේ! සර්වදයාබරිත වූ ජේසුනී, මා ගැන අනුකම්පා වූව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

මාගේ හෘදයේ අන්තිම සුසුම්ලෑම් වලින් මාගේ ආත්මය මේ කයෙන් පිටත්වෙන්ට දඟලන කල්හි, ඔබවහන්සේ වෙතට එන්ට මාගේ ආශාවේ ලකුණක් කොට ඒවා පිළිගෙන, අනේ! සර්වදයාබරිත වූ ජේසුනී, මා ගැන අනුකම්පා වූව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

ශීතලවූද, පන නැතිවූද, මේ ශරීරයෙන් මාගේ ආත්මය පිටත් වී, මෙලොවින් සදාකාලයටම තුරන්දුවෙන කල්හි, මාගේ ජීවිතය නැතිවීමෙන් ඔබට මම කරන නමස්කාරයක් මෙන් ඒ පිළිගෙන, අනේ! සර්වදයාබරිත වූ ජේසුනී, මා ගැන අනුකම්පා වූව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

මාගේ බන්ධු මිත්‍රයන් මාගේ යහන වටේ සිටිමින්, මා වෙත දයාවෙන් කඳුළු වගුරා මා උදෙසා යාච්ඤා කරන කල්හි, අනේ! සර්වදයාබරිත වූ ජේසුනී, මා ගැන අනුකම්පා වුව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

හදිසියෙන් හෝ නොදැනුවත්ව වත් මට මරණය පැමුණුනත් මාගේ එම භයානක මොහොතේදී, පමා නොවී කල්හි, අනේ! සර්වදයාබරිත වූ ජේසුනී, මා ගැන අනුකම්පා වුව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

අන්තිමකොට මාගේ ආත්මය ඔබවහන්සේට අභිමුකවී, ඔබවහන්සේගේ මහෝත්තම කමේ අමරණීය වූ දීප්තිය ප්‍රථම වතාවට දකින කල්හි, අනේ මා ඔබවහන්සේගේ සම්මුඛයෙන් නොපන්නා ඔබට සදාකාලයටම වන්දනා කරන පිණිස ඔබගේ කරුණාව නැමති සෙනෙහෙවන්තවූ ශ්‍රී කුමාරයාට මා එක්වෙන්නට සැලැස්සුව මැනව. කල්හි, අනේ! සර්වදයාබරිත වූ ජේසුනී, මා ගැන අනුකම්පා වුව මැනව.

*මාගේ ජේසුනී, මට අනුකම්පා කළ මැනව.*

## යාච්ඤා කරම්හ

අහෝ! මාගේ දෙවියනී, ඔබවහන්සේ අපේ මරණ දින, පැය, වේලාව රහස්කර අප මරණ අව්වුවට පත් කළාවේද! ඒ නිසා සාධාරණකමෙන් හා ශුද්ධ කමෙනුත් අපේ ජීවිතය සැම දිනවලම පසුකර, යහපත් හෘදය සාක්ෂියේ සමාදානයෙන් මෙලොවින් තුරන්දු වෙන්ටත්, ඔබගේ ප්‍රේමය ඇතුව මැරෙන්ටත්, අපි හේතුකාරයන් වන ලෙස වරම් දෙනවා සොඳේ.



මේ කීදේ ඔබ ප්‍රිය පුත්‍රවූ ජේසු ස්වාමිදරුවන්ගේ ශුද්ධවූ දුක්ප්‍රාප්තිය උදෙසා ද, උන්වහන්සේගේ දිව්‍ය රුධිරය සහ ශ්‍රී වණ කැළැල් උදෙසා ද, උන්වහන්සේ මල් උයනේදී වින්ඳාවූ මරණාසන්න දුක සහ කුරුසියෙහි උකුත්වීම උදෙසාද, අපට ලැබෙන මෙන් ජේසු ස්වාමිදරුවන්ගේ ශ්‍රී නාමයෙන් සහ උන්වහන්සේ සමඟද ඉල්ලා සිටිමු. ආමෙන්!

## තුන්වෙනි පැයකාල

*"මා සමග එක පැයක්වත් පිබිද සිටින්නට නුඹලාට බැරි උනාද? (මතෙව් 26:40)*

අහෝ මාගේ ආත්මයෙනි! ජේසු ස්වාමිදරුවෝ උන්වහන්සේගේ ප්‍රිය දියණියට සුසුම්ලා වදාළ කන්නලව්වට ඇහුම්කන් දෙනු.

මාගේ මුළු දුක්ප්‍රාප්තියෙහි වින්ඳාවූ ශාරීරික වේදනාවලට වඩා මල් උයනේදී මා හෘදය තුළ දුක් වින්දෙමි...... මනුෂ්‍යයින්ගේ පාප මා කෙරෙහි ගෙන, දේව ශුද්ධත්වය ඉදිරිපිට මම සිටියෙමි. උන්වහන්සේද මාගේ නිදොස්කම නොසලකා, තමන්වහන්සේගේ කෝපය මා පිට පමුණුවා උන්වහන්සේගේ සාධාරණ විනිශ්චයෙන් නියමවූ කදුර කසට සහ තිත්ත පාත්‍රය පානය කරන්නට මට නියම කළ සේක. මා වින්ඳාවූ අධික දුක් වේදනාව යම් මනුෂ්‍යයෙකුට තේරුම් ගන්නට නොහැකිය.

අහෝ මේ ඉසිලිය නොහැකි දුක් ශෝකයේදී, උන්වහන්සේ තෝරා ගත් මිත්‍රයන් වන ගෝලයන් වෙත තුන්වරක් හැරී ආ සේක! එවිට ඔවුහු උන්වහන්සේ ගැන කල්පනාවක්වත්, උන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය ගැන කිසි අනුකම්පාවක්වත් නැති ආකාරයෙන් නිදා ඉන්නා දැක උන්වහන්සේ කොපමණ දුක් කණගාටුවට පත්වූ සේක්ද කිවහොත්, "මාගේ අපෝස්තුළුවරුන් විසින් ඒ පැයේදී මා අත්හැරීමෙන් දුක් ශෝකයට පැමිණ 'මා සමග පැයක්වත් පිබිද සිටීමට නුඹලාට බැරිදැ' යි අවවාද කිරීමට පවා හේතුවූ දුකට මෙම ශුද්ධවූ පැයේ භක්තියෙන් සැනසීම දෙන පිණිස උන්වහන්සේ මර්ගරීතා මරිය තුමියගෙන් ඉල්ලූ සේක.

(සියල්ලෝ) "ජේසුනී, ඔබ උදෙසා ජීවත් වෙමි. ජේසුනී, ඔබ උදෙසා නසින්නෙමි. ජේසුනී, ජීවිතයෙහිදී ද, මරණයේදී ද, මම ඔබවහන්සේගේ වෙමි.

(100 දවස් පූර්ණ එල)

අහෝ! මාගේ ජේසුනී, මල් උයනේදී ඔවුන් නිදා ඉන්නා දැක ඔබ මෙපමණ ශෝකයට පැමුණුනු සේක් නම් ඔබ අප උදෙසා සත්ප්‍රසාදයෙහි රෑ දවල් දෙකේහිම සිරකාරයෙක් මෙන් සිටිමින්, මනුෂ්‍යයන්ගෙන් ලබන්නාවූ නොසැලකීම් සහ අවමානද ද්‍රෝහිකම් ද ඔබගේ දිව්‍ය හෘදයට කොපමණ ශෝක හටගන්නා කරුණු වේද?

"මනුෂ්‍යයන්ට මෙපමණ ප්‍රේම කළාවූ හෘදය බලනු...... ඊට සැලකීමක් වශයෙන් මනුෂ්‍යයන් වැඩි කොටසෙන් මට ලැබෙන්නේ මේ මාගේ ප්‍රේමයේ ප්‍රසාද නිධානය

කෙරෙහි ඔවුන් දක්වන ඇල්මැරුණු ගතියෙන් සහ අපහාස කිරීමෙන් පෙන්වන්නාවූ නොසැලකීම් සහ දේව ද්‍රෝහිකම වේ. මාගේ දුක්ප්‍රාප්තියේදී වින්දාවූ සියලු දුක් ගාවිනාවලට වඩා මේ කරුණු මට වඩා දුක් සහිත වන්නේ, ඔවුන් යම්..... ස්වල්ප වශයෙන්වත් මාගේ ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දෙන්නේ නම්..... ඔවුන් උදෙසා හැකිනම් තවත් වඩා දුක් ගාවිනා විඳින්නට මම ආශාවෙමි" යි ඔබවහන්සේ වදාළ සේක් වේද?

අනේ මාගේ පෙම්බර ජේසුනී, යම් විටක යාච්ඤා කිරීමට හෝ දේව මෙහෙයෙහි කොයියම් කාරණාවකදී හෝ ඒ නොසැලකීමට යම් පරීක්ෂාවක් හට ගත්තොත් ඔබවහන්සේ දුක් ශෝකයෙන් පිරී "මා සමඟ එක පැයක්වත් පිබිද සිටින්නට නුඹලාට බැරිවූනාදැ" යි (මතෙව් 26:40) වදාළා වූ කන්නලව්ව සිහිකර, ඔබවහන්සේව තව වඩා ප්‍රේමයෙන් ජ්වලිතව අදහා ගැනීමට මට පිහිට වුව මැනව.

අහෝ මාගේ අමෘතබර වූ ජේසුනී, මින්මතු මම කොතැන්හිදීත්, රාත්‍රියේ පිබිදෙන වේලාවලදීත්, මා උදෙසා සත්ප්‍රසාදයෙහි වැඩසිටින්නාවූ ඔබ නිතර සිහිකර ඔබට මාගේ ආදරය ඔප්පු කරන්ටත්, ඔබ ආත්මීක වශයෙන් මාගේ හෘදය තුළට කැඳවා ගන්ටත්, දේවස්ථානය ඉදිරිපිටින් යන විට ඔබ සිහිකර ඔබට ගෞරව කරන්ටත් පහසු තිබෙන සැටියට දේවස්ථානයට ඇතුල් වූ ඔබට සුළු යාච්ඤාවක් ඔප්පු කරන්ටත්, නිතර නිතර ඔබවහන්සේ සත්ප්‍රසාද මාර්ගයෙන් මා හෘදය තුළට ලබා ගන්නටත් මට පිහිටාශිර්වාදය කළ මැනව.

## ප්‍රතිකාර ප්‍රාර්ථනාව

ආ ජේසුස් ස්වාමිදරුවනී! දිව්‍ය ගැලවුම්කාරයාණෙනී! ඔබ දිව්‍ය හෘදයේ බිලිපඬුරක් වන ඔබවහන්සේගේ දරුවන් පිට කරුණා බැල්මලා වදාරණවා සොඳේ. ඔවුහු විශ්වාසයේත් ප්‍රතිකාරයේත්, ප්‍රේමයේත් එකම සිත් අභිප්‍රායෙන් එකමුතුව් තමුන්ගේද කාලකණ්ණි සියලු පව්කාරයින්ගේද, අවිශ්වාසවන්තකම ගැන දුක්මනස්ථාපයෙන් තැවී සිටිති. අප විසින් කරන්නට යන එක්සිත්වූද, ප්‍රසිද්ධවූද, වාක්දාත වලින් ඔබවහන්සේගේ දිව්‍ය හෘදය දයානුකම්පා වී අපටද, ලෝකයාටද, ඔබවහන්සේට ප්‍රේම නොවන අවාසනාවන්තවූ සියල්ලන්ටද ඔබට ප්‍රේම වෙන්ට කරුණාව ලැබේවා.

මින්මත්තට අපි සියල්ලෝ වාක්දාතයක් දෙමු. එනම්:–
මනුෂ්‍යයන්ගේ මතක නැතිකමත් කෙළෙහි ගුණ නැතිකමත් උදෙසා,
දිව්‍ය සත්ප්‍රසාද මණ්ඩපයෙහි ඔබවහන්සේ ප්‍රතික්ෂේප කරනු ලැබීම උදෙසා,
පව්කාරයන්ගේ අපරාධ උදෙසා,

අභක්තිවූවන්ගේ වෛරය උදෙසා,
ඔබවහන්සේට කියන ලද අපහාස වචන උදෙසා,
ඔබවහන්සේගේ දෙවිකයට කරන ලද අනදර උදෙසා,
ඔබවහන්සේගේ ප්‍රේමයේ ප්‍රසාද නිධානය දූෂ්‍ය කරන ද්‍රෝහිකම් උදෙසා,
ඔබවහන්සේගේ දිව්‍ය සම්මුඛයෙහි සිද්ධකරන ලද අගෞරවාචාරයත්, අවමානයත් උදෙසා,
වන්දනීය වූ බිලිපූජාවක් වන ඔබවහන්සේට කරන ලද තද අනදර උදෙසා,
ඔබවහන්සේගේ දරුවන්ගෙන් මහත් කොටසක් දක්වන අලසකම උදෙසා,
ඔබවහන්සේගේ ප්‍රේමවන්ත අවවාද සුළුකිරීම උදෙසා,
ඔබවහන්සේගේ මිත්‍රයෝය කියමින් මග හරින ඔවුන්ගේ අවිශ්වාසය උදෙසා,
ඔබවහන්සේගේ වරප්‍රසාද නිරර්ථක කිරීම උදෙසා,
අපේ අවිශ්වාසවන්තකම උදෙසා,
අපේ හෘදයන්ගේ අචින්ත්‍යවූ දැඩිකම උදෙසා,
ඔබවහන්සේට ප්‍රේම කිරීමට අපේ දීර්ඝ ප්‍රමාද කිරීම උදෙසා,
ඔබවහන්සේගේ දේව මෙහෙයෙහි අපේ ඇල්මැරුණු ගතිය උදෙසා,
ආත්මයන් විනාශ වෙන නිමිත්තෙන් ඔබවහන්සේගේ තිත්ත දුක්කනගාවූ උදෙසා,
ඔබවහන්සේ අපේ හෘද ද්වාරය ළඟ ආසාවෙන් බලා වැඩ සිටීම උදෙසා,
ඔබවහන්සේගේ සිත වේදනා කරවන දුජ්ඨ හෙළාදැකීම් උදෙසා,
ඔබවහන්සේගේ ප්‍රේමවන්ත සුසුම්ලෑම් උදෙසා,
ඔබවහන්සේගේ ප්‍රේමවන්ත කඳුළු උදෙසා,
ඔබවහන්සේගේ ප්‍රේමවන්ත සිරගතවීම උදෙසා,
ඔබවහන්සේගේ ප්‍රේමවන්ත උකුත්වීම උදෙසා,

## යාච්ඤා කරම්හ

ජේසු ස්වාමිදරුවනි, දිව්‍ය ගැලවුම්කාරයාණෙනි, ඔබවහන්සේගේ දිව්‍ය හෘදයෙන්ම දුඃඛිත වූ මැසිවිල්ලක් නික්මුණේය. එනම්: “මා සනසන්නෙකු බලා සිටි නමුත් කිසිවෙක් සම්භනුනේය.” අපි ඔබවහන්සේට ඔප්පුකර සිටින සුළු සැනසීම කරුණාවෙන් පිළිගත මැනව. මින්මතු ඔබවහන්සේට අප්‍රසන්න සියල්ලෙන් වැඩි වැඩියේ අහක්වී යන්නටත්, සියල්ලෙහි ද සෑම තැන්හිදී සහ සදාකල්හිත් අපි ඔබවහන්සේගේ දිව්‍ය හෘදයේ අති විශ්වාසවන්තවූද, ජීවලිත භක්තිවූද, දරුවන් බව ප්‍රකාශ කරන සැටියට ඔබවහන්සේගේ වරප්‍රසාද අපට දෙනවා සොඳේ. එකම දෙවි වූ පියාණන් වහන්සේ සමගද, ස්ප්‍රීතු සාන්තුවහන්සේ සමගද, සදාකාලයටම ජීවත් වන්නාවූද, රජකම් කරන්නාවූද, ඔබවහන්සේගේ දිව්‍ය හෘදය බලා එසේ ලැබෙන මෙන් උදක්ම ඉල්ලා සිටිමු.

ආමෙන්.

- ගීතිකාව

## සතරවෙනි පැයකාල

*"මනුෂ්‍ය කුමාරයා පව්කාරයන් අතට අසුවන වේලාව පැමිණුනේය. මෙතැනින් නැගිට යමිහ. (මතෙව් 26:46)*

මාගේ අමෘතබරවූ ජේසුනී, අප විසින්ම පාප ප්‍රස්ථාවල් සොයමින් කැමැත්තෙන්ම පාපයට වැටෙන නිසා ඊට ප්‍රතිකාර වශයෙන් ඔබ පාවා දෙන්නට එන්නාවූ ජුදාස් සහ ඔබට මෙපමණ දුක් දී කුරුසියෙහි ඇණ ගැසීමට පවා ලෑස්තිව සිටින්නාවූ ජුදයින් වෙතද ඔබවහන්සේම මෙපමණ ප්‍රීතියෙන් යන සේක් වේද?

අනේ මාගේ මධුරවූ ජේසුනී, යම් පාප පරීක්ෂාවක් හෝ පාපිෂ්ඨ ආශාවක් මා තුළ හටගන්නා විට, එය කොපමණ සුළු පාපයක් වූ නමුත්, එම පාපයට බිලිපඬුරක් මෙන් මෙපමණ දුක් විඳ කුරුසියෙහි ඔප්පු වුනාවූ සහ ලෝකාන්තිමය වන තුරු සත්ප්‍රසාදයෙහි සිට ඔප්පුවෙන්නාවූ, ඔබගේ දුක්ප්‍රාප්තිය සිහිකරන්නට මට පිහිට වූව මැනව. මෙම සත්ප්‍රසාදයෙහි වාසය කරමින්ම මුළු ලෝකයේම සියල්ලන් විසින් කරන්නාවූ සියළු පාපවල් ඔබ දකිනා බවද මම කල්පනා කර, "මනුෂ්‍ය කුමාරයාණෝ පව්කාරයන් අතට අසුවෙන වේලාව පැමුණුනේය. මෙතැනින් නැගිට යමිහ" යි යන ඔබවහන්සේගේ කන්නලව් ඉල්ලීමට ඇහුම්කන් දීමට මට ආශීර්වාද කළ මැනව.

ඔබවහන්සේ මා සමග සිටින බව සිහිකර, ඔබවහන්සේ කෙරෙහි මා විශ්වාසය තබා ඔබවහන්සේ සමග එම පාප පරීක්ෂාව අත්හැර දැමීමට මට වරප්‍රසාද දුන මැනව. "අපි එනම්, ජේසුස් ස්වාමිදරුවෝ මා සමගද, මම උන්වහන්සේ සමගද, අපි 'මෙතැනින්' එනම්, මෙම පාප පරීක්ෂාව දුරු කර නැගිට යමිහ" සැබැවින්ම මා ශක්තිමත් කරන්නාවූ තැනැන්වහන්සේ තුළ මට සියල්ලම කරන්නට පුළුවන. (පිලිප්පි 4: 13)

(සියල්ලෝම) සුපරිශුද්ධ පරම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට සෑම මොහොතවලදීම ස්තුති ප්‍රශංසා කරනු ලබන සේක්වා.

(දවස් 100 පූර්ණඵල)

අහෝ මාගේ ආත්මයෙනි, අපි යම් විටෙක යම් පාපයකට වැටී හෝ යම් පාප පරීක්ෂාවක යෙදී සිටින්නෙමු නම් උන්වහන්සේ ශු. පේදුරු තුමන්ගේ මෙන් අපේ හෘදවල් ද පශ්චත්තාප ප්‍රේමයෙන් දැල්වීමට අප වෙතත් බලන සේක.

උත්වහත්සේගේ මේ කරුණා බැල්ම නොසලකා අපි සිටින්නෙමු නම් ජූදාස්ට කීවාක් මෙන් ඉතා දයානුකම්පාවෙන් "මිත්‍රය, තුම කුමකට පැමිණියෙහිද" (මතෙව් 26: 50) " ජූදාස් තුඹ සිඹීමින් මනුෂ්‍ය පුත්‍රයාණන් පාවා දෙන්නෙහිදැ" යි (ලූක් 22: 48) අපටත් කියන සේක.

අප පෙම්බර ජේසු ස්වාමිදරුවෝ පිතාවන දෙවියන් ඉදිරියෙහි, මල් උයනේදී සහ කුරුස ගසේදී මෙන්, දැනුත් ස්වර්ගයෙහි සහ සත්ප්‍රසාදයෙහි ද වැඩ සිට අප ශාරීරික දුර්වලකම පියාණන් වහන්සේට පෙන්වා දෙන සේක. "ආත්මය කැමතිය එහෙත් ශරීරය දුර්වලය" තවද අපි පාපයෙහි රෞද්‍රකම නොදැන පාපයට වැටෙන බව කියා "පියාණෙනි, මොවුන් කරන වරද නොදැන කරන සෙයින් මොවුන්ට ක්ෂමා වුව මැනව" යි උත්වහත්සේ අප උදෙසා යාච්ඤා කරන සේක.

"යක්ෂ පරීක්ෂාවලට අසුනොවන ලෙස සැලකීමෙන් සිට යාච්ඤා කරපල්ලාය" යි අපට අවවාද කර, අප සහෝදර ප්‍රේමයෙන් මෙලොව එකමුතු කර, දේව ත්‍රිත්වයට සදාකාලයටම අප එකග කරගන්නා පිණිස මෙසේ යාච්ඤා කරන සේක. "ශුද්ධවූ පියාණෙනි, ඔබවහන්සේ මට භාරකළාවූ ඔවුන් ඔබවහන්සේගේ නාමයෙන් රක්ෂා කළ මැනව. ඔවුන් සියල්ලන් එකත්වයට සිටින පිණිස පියාණෙනි, ඔබ මා තුළද මා ඔබ තුළද සිටින්නාක් මෙන්, ඔවුන්ද අප තුළ එකග කළ මැනව." (ජොහාන් 17: 11-21)

(සියල්ලෝම) අනේ පෙම්බර ජේසුනි, අපෙන් සියලු ආකාර කෝප, ද්‍රෝහී සිත් දුරුකර අපේ සතුරන්ට ක්ෂමාකර, ඔබ උදෙසා සියල්ලන් සමග ප්‍රේමයෙන් සිටින්නට අපට පිහිට වුව මැනව. ඔබ දිව්‍ය හෘදය තුළ අප එකග කරගත මැනව.

## මුළු ලෝකය ජේසු තුමන්ගේ දිව්‍ය හෘදයට කැපකිරීමේ යාච්ඤාව

අති අමෘතබරවූ ජේසුනි! මනුෂ්‍ය ජාතීන්ගේ ගැලවුම්කාරයාණෙනි, ඔබගේ පූජාසනය හමුවෙහි බැගෑපත්ව වැඳ වැටී සිටින අප වෙත දයා බැල්මලා වදාළ මැනව. අපි ඔබට අයිති වෙමු. සැමකල්හිත් අපි ඔබට අයිතිවෙන්ට කැමැත්තෙමු. තවද ඔබ හා සමග වඩා ස්ථිරව එකග වෙන පිණිස අද දිනදී ස්වකීය කැමැත්තෙන්ම අපෙන් එක එකා ඔබගේ දිව්‍ය හෘදයට තම තමා කැප කරයි.

(කැමති නම් මේ වෙනුවට **25** වෙනි පිටේ පෙන්වන්නාවූ "ජේසුස් ස්වාමිදරුවන්ගේ දිව්‍ය හෘදයට ප්‍රතිකාර ආරාධනාව" ඔප්පු කරනු).

බොහෝ ජනයෝ කවරකලකවත් ඔබ ඇඳින නොගත්තෝය. බොහෝ දෙනාද ඔබගේ පණත් හෙළා දැක ඔබ ප්‍රතික්ෂේප කළෝය. අති දයාබර ජේසුනි! ඔවුන් සමස්තයන්ට ඔබ දයානුකම්පාවී ඔබගේ දිව්‍ය හෘදය කරා ඔවුන් ගෙන්වා වදාළ මැනව.

ස්වාමිනී, කොයිකලකදීවත් ඔබගෙන් ඉවත්ව නොගිය විශ්වාසකයින්ට පමණකුත් නොව, ඔබට පිටුපා ගිය අකීකරු දරුවන්ටත් ඔබ රජාණන් වන සේක්වා. ඔවුන් කාලකණ්ණි කමින්ද, සාගින්නෙන්ද විනාශ නොවන සැටියට ස්වකීය දෙව්පියාණන්ගේ ගෘහයට වහාම නැවත හැරී එන මෙන් කරුණා කළ මැනව.

වැරදි මත වලින් රවටනු ලැබූ නොහොත් ස්වකීය ඇල්මවලින් මුලාවී ගියවුන්ටත් ඔබ රජාණන් වන සේක්වා! එකම බැටළු රැළක්ද, එකම එඬේරෙක්ද වෙන සැටියට සත්‍යතාවයේත් විශ්වාස ඒකත්වයෙත් වරායට ඔවුන් ගෙන්වුව මැනව.

ස්වාමිනී! ඔබගේ ශුද්ධවූ සභාවට ස්ථිරවූද, බාධා නැතිවූද, නිදහස දුන මැනව. සියලු දේශ ජනයන්ට නිසි ක්‍රමය හා සමාදානය දෙවා වදාළ මැනව. මේ ලෝකයේ සීමාවෙන් සීමාවට සැම තැන්හි අපට ගැලවීම සම්පාදනය කළ දිව්‍ය හෘදයට ප්‍රශංසා ලැබේවා. උන්වහන්සේට මහිමයත් ගෞරවයත් සදාකල්හි ලැබේවායි සමස්තයෝ එකම ශබ්දයෙන් කියත්වා.

ආමෙන්.

- ගීතිකාව

## අවසාන යාච්ඤාව

මාගේ පෙම්බර ජේසුනි! ඔබ සමඟ මේ පැයේදී අඬා වැලපී දුක් ශෝකයෙන් පිරී සිටින්නාවූ ඔබගේ දිව්‍ය හෘදයට සැනසීම දීමට ඔබ මා භාරගත් හෙයින්, මාගේ මුළු හෘදයෙන් ඔබට ස්තුති කර මාගේ ප්‍රේමය ඔබට ඔප්පු කරමි.

අනේ මාගේ ජේසුනි! ඔබවහන්සේගේ දුක්ප්‍රාප්තිය ගැන මාගේ හෘදය තුළ නිතර සිහිකර, සත්ප්‍රසාදයෙහි වැඩ සිටින්නාවූ ඔබ සමඟ එකඟව දෙවියන් වහන්සේ විසින්ම මට දෙන්ට යෙදෙන්නාවූ සැප සහ දුක්ද, ලෝක සුව සැප වස්තු මාන්‍යාදිය හා රෝග පීඩාදිය සියල්ලම ඔබවහන්සේට ස්තුති කොට භාරගැනීමට මට වරම්

දුන මැනව. ඔබ සමග ප්‍රීතියෙන් ඒ සියල්ලම දරමින් මාගේ මුළු ජීවිතය ඔබ කෙරෙහි ප්‍රේමයෙන් පසුකරන්නට මට පිහිට වුව මැනව.

මාගේ පෙම්බර ජේසුනි! ඔබවහන්සේගේ පිහිටාශිර්වාදයෙන් මේ පැයේදී, ඔබ මල් උයනේදී මරණාසන්නව වින්දාවූ දුකට සහ සත්ප්‍රසාදයෙහිදී එබ ලබන්නාවූ දුක් අවමානවලටද, මම දෙන්නාවූ සැනසීම උදෙසා මා කෙරෙහි කරුනා බැල්මලා මාගේ ඉල්ලීමට ඇහුම්කන් දුන මැනව. එනම්......

(මෙහි නුඹලාට උවමනාවූ විශේෂ පිහිට උපකාර, විශ්වාස ඒකාන්තයෙන්ම ඉල්ලනු. නුඹලා විසින් මෙම පැයේදී උන්වහන්සේට ඔප්පු කළාවූ සැනසීම උදෙසා උන්වහන්සේගේ ශ්‍රී හෘදය නුඹලා කෙරෙහි අධික ප්‍රේමයෙන් දැල්වී, නුඹලාට දෙන්ට ඉතා ආදරයෙන් සිටින සේක.)

තවද අනේ ජේසුනි, අයහපත් සහ සදි මරණයෙන් මා ගළවා ගත මැනව.

මම මේ පැයේදී ඔබවහන්සේ සමග සිට ඔබවහන්සේට මාගේ ප්‍රේමය සහ සැනසීමද ඔප්පු කරන්නාක් මෙන්, මාගේ මරණාසන්න මොහොතේදී ඔබ මා සමග සිට මා සැනසුව මැනව. සත්ප්‍රසාද මාර්ගයෙන්ද ඔබ මා හෘදය තුළට වඩවාගෙන කුරුසියෙහි උකුත්වුනාවූ ඔබ සමග, "පියාණෙනි, මාගේ ආත්මය ඔබවහන්සේගේ ශ්‍රී හස්තවලට භාරකරමි" යි කියා මාගේ ප්‍රාණය ඔප්පු කිරීමට මට පිහිට වුව මැනව. "මාගේ ජේසුනි, මම ඔබට ආදරේ වෙමි" යි කියමින් ඔබගේ දිව්‍ය හෘදයට එකමුතු වීමට මට පිහිටාශිර්වාද කළ මැනව. ඔබගේ ශ්‍රී මුඛයෙන් "අද දින නුඹ මා සමග ස්වර්ගයෙහි සිටින්නෙහිය" යි යන වාක්‍යය අසන්නට මා වාසනාකාරයෙක් වෙන ලෙස, ඔබගේ ප්‍රසාද උපකාරය මට දෙවා වදාළ මැනව.

වික්ෂෝප මාතාවෙනි, මාගේ පෙම්බර මෑණියෙනි, ඔබ ප්‍රේම පුත්‍රයා මල් උයනේදී ඔබවහන්සේගෙන් වෙන්වී මරණාසන්නව සිටින විට, උන්වහන්සේට යම් සැනසීමක් දීමට නොහැකිව සිටිය බැවින් ඔබවහන්සේගේ හෘදය තුළ හටගත්තාවූ දුක්ශෝකය සිහිකර, මාගේ මරණාසන්නයේදී මා අත්නැරිය මැනව. උන්වහන්සේ කුරුසියේ එල්ලී උකුත්වුන විට, උන්වහන්සේ ළඟ සිට, උන්වහන්සේගේ මෘත ශරීරය ඔබ ශ්‍රී හස්ත වලට ගත්තාක් මෙන් ඔබ මාද තුරුල්කරගෙන, මෙම භයානක මොහොතේදී මගෙන් යක්ෂයා සහ උගේ පරීක්ෂාත් දුරුකර, මාගේ සැනසීමද, මාගේ ගැලවීමද වුව මැනව.

ආමෙන්.

# දිව්‍ය සත්ප්‍රසාද ආශීර්වාදය

ආ උතුම් මේ අභිරහස දෝත් මුදුන් දී වඳිමු
බැහැර වේ පුරාණ තේවා දැන් පිදේ පිදුම් අමා
දුබල වූ ඉඳුරන්ට පිහිට වේ විශ්වාසය

දෙව්පියාට දෙව්පුතුන්ට වේ පසස් මඟුල් ගොසා
වන්දනා ගරු විකුම්ද ආසිරි සිරිත් වේවා
මේතුමන් කෙරෙන් නිකුත් වූ සා වැනුම් සුදත් මටා

ඔබවහන්සේ ස්වර්ගෙයෙන් පූපය ඔවුන්ට දෙවා වදාල සේක
සෑම ප්‍රබෝධයක්ම එහි අඩංගු වී ඇත්තේය

# යාච්ඤා කරම්හ

ජේසුස් ක්‍රිස්තුස් ස්වාමීනි, ඔබවහන්සේගේ දුඃඛ ප්‍රාප්තියේ හා මරණයේ සිහිවීම ලෙස මේ පුදුමාකාර ප්‍රසාද නිධානය අපට දානය කළසේක් වේද! ඔබගේ ගැළවීමේ ඵල අප සිතට නිතර දැනෙන ආකාරයෙන් ඔබවහන්සේගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට කිසි ගෞරවයෙන් වන්දනාවාර කිරීමට ද ඔබවහන්සේගේ රාජ්‍යයේ සාමය අත්දැකීමට ද අපට වරම් දුන මැනව. ඔබවහන්සේ සදහට ම වැජඹෙන සේක! රජකම් කරන සේක!
ආමෙන්.

## දේව ප්‍රශංසා

දෙවියන් වහන්සේ!
උන්වහන්සේගේ ශ්‍රී නාමය
සැබෑවූ දෙවියන් වහන්සේද, සැබෑවූ මනුෂ්‍යයාද වන ජේසු ක්‍රිස්තු ස්වාමිදරුවෝ
ජේසුස් ස්වාමිදරුවන්ගේ ශ්‍රී නාමය
උන්වහන්සේගේ ශ්‍රී හෘදය
උන්වහන්සේගේ අමිල වූ ශ්‍රී රුධිරය
සැනසිලිදායකයාණන්වූ ස්ප්‍රිතු සාන්තු වහන්සේ
උත්තම දේවමාතාවන්වූ අති ශුද්ධවූ මරියවහන්සේ
උන්වහන්සේගේ ප්‍රතාපවත් ස්වර්ගාරෝපණය
කන්‍ය මාතාවන්ගේ මරිය යන ශ්‍රී නාමය
උන්වහන්සේගේ ව්‍රතශුද්ධවත් පතිවූ ශුද්ධවූ ජුසේතුමා
දෙවියන් වහන්සේ තමන් දූතයන් හා ශුද්ධවන්තයන් කෙරෙහි,

ආශීර්වාද ඔබට

- ගීතිකාව